**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

PEOPLE'S INSURANCE
EMPOWERING A RESILIENT NATION

<u>මහජන වගකීම් රක්ෂණය - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය</u>

ඔප්පු වර්ගය: මහජන වගකීම් රක්ෂණය

ලබා දෙනු ලබන මූලික ආවරණය:

රක්ෂිතයා විසින් තෙවන පාර්ශවයන්ට පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ගෙවිය යුතු වන (නඩුකර වියදම් ඇතුළුව) සියලුම වියදම්,

- පුද්ගලයකුගේ හදිසි අනතුරු මරණය හෝ ශාරීරික තුවාල හෝ අසනීපය
- රක්ෂිතයාගේ පරිශ්‍රය තුල සිදු කෙරෙන ව්‍යාපාර කටයුතු වලදී හෝ ඒ සම්බන්ධය ඇතිවන අනපේක්ෂිත අලාභ හෝ භෞතික හානි

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 බලන්න)*

<u>අමතර ආවරණ:</u>

ඔබගේ ඔප්පුවේ සඳහන් කර ඇති පරිදි වෙනත් ඕනෑම අමතර ආවරණ.

<u>ප්‍රධාන ලක්ෂණය(යන්):</u>

මෙම ඔප්පුව රක්ෂිතයාට වන්දි ලබා දෙනු ලබන අතර,

අ. රක්ෂිතයා ඉල්ලා සිටින්නේ නම්:

i. රක්ෂිතයාගේ ඕනෑම අධ්‍යක්ෂවරයකුට හෝ සේවකයකුට,

ii. රක්ෂිතයාගේ සමාජ, ක්‍රීඩා, සුභසාධන, ගිනි, ප්‍රථමාධාර හෝ ගිලන් රථ සේවාවල ඕනෑම නිලධාරියකුට හෝ සාමාජිකයකුට

ආ. ව්‍යාපාරය අතරතුර රක්ෂිතයා වෙනුවෙන් රැකියාවක් කරන ඕනෑම ප්‍රධානියෙකු ප්‍රධානියාගේ, ඔහුගේ සේවකයින්ගේ හෝ නියෝජිතයින්ගේ කිසියම් ක්‍රියාවක් හෝ අතපසු වීමක් හේතුවෙන් හෝ එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවන ඕනෑම තුවාලයකට හෝ හානියකට රක්ෂිතයා වගකිව යුතු නොවේ.

ඇ. මෙම ඔප්පුව යටතේ වන්දි ලබා ගැනීමට හිමිකම් ඇති ඕනෑම පුද්ගලයකුගේ නීත්‍යානුකූල නියෝජිතයා, එම පුද්ගලයා දරනු ලබන වගකීම සඳහා

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

PEOPLE'S INSURANCE
EMPOWERING A RESILIENT NATION

අධිකරණ බල ප්‍රදේශය පිළිබඳ වගන්තිය

මෙම ඔප්පුවේ නියමයන් යටතේ රක්ෂිතයාට වන්දි ගෙවීම අදාළ වන්නේ, ශ්‍රී ලංකාව තුල නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් ප්‍රථම වරට ලබා දෙන ලද හෝ ලබා ගන්නා ලද විනිශ්චයක් සම්බන්ධයෙන් පමණි.

*(ප්‍රධාන ලක්‍ෂණ පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 සහ 02 බලන්න)*

<u>ආවරණය නොවන දේ (ව්‍යතිරේක):</u>

1. ගිවිසුමක් නොමැති නම් ඇති නොවන සහ ගිවිසුමක් මගින් රක්ෂිතයා විසින් භාරගන්නා ලද වගකීම
2. සේවා ගිවිසුමක් හෝ ආධුනිකත්ව ගිවිසුමක් යටතේ රක්ෂිතයා විසින් සේවයේ යොදවා ඇති ඕනෑම පුද්ගලයකුට රක්ෂිතයා වෙනුවෙන් සේවය කිරීමෙන් ඇතිවන තුවාලයෙහි අනුශංගයක් වශයෙන් ඇතිවන වගකීම
3. හදිසි සහ හඳුනාගත හැකි අනතුරකින් හෝ සිදුවීමකින් ඇති නොවන ශාරීරික තුවාල සඳහා වූ වගකීම
4. දේපලවලට සිදුවන හානි,

   අ) රක්ෂිතයාට අයිති, කුලියට ලබා දී ඇති, පදිංචිවී සිටින හෝ භාවිතා කරන හෝ රක්ෂිතයාගේ ඕනෑම සේවකයකුගේ හෝ නියෝජිතයකුගේ හෝ රැකවරණයේ, භාරකාරත්වයේ හෝ පාලනය යටතේ ඇති:

   ආ) රක්ෂිතයා හෝ රක්ෂිතයාගේ ඕනෑම සේවකයකු හෝ නියෝජිතයකු සේවය කරන හෝ සේවය කළ ඕනෑම දේපලක කොටසකට:

   ඇ)ගිනි ගැනීමක් හෝ පිපිරීමක් හේතුවෙන් සිදවන ඍජු හෝ වක්‍ර හේතුවක් හානි

5. කම්පනය නිසා හෝ ඕනෑම භූමි ගොඩනැගිල්ලක හෝ වෙනත් ව්‍යුහයක ආධාරකයක් ඉවත් කිරීම හෝ දුර්වල කිරීම හෝ බාධා කිරීම නිසා සිදුවන හානිය
6. පහත සඳහන් කරුණු හේතුවෙන් සිදුවන ශාරීරික තුවාල හෝ දේපළ හානි:

   අ) රක්ෂිතයාගේ උපදෙස් මත හෝ මගපෙන්වීම යටතේ ලබා දෙන හෝ පරිපාලනය කරන වෘත්තීය ස්වභාවයේ (ප්‍රථමාධාර ප්‍රතිකාර හැර) ඕනෑම උපදෙසක් හෝ ප්‍රතිකාරයක් මගින් හෝ ඒ හරහා හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන,

   ආ) පිරියත යන මාතෘකාව යටතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති නම්, ඕනෑම එසවුම් උපකරණයක්, පීඩන භාජනයක් හෝ පිරියතයක් නිසා ඇතිවන,

   ඇ) ජීවිත රක්ෂිතයා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන යන්ත්‍රයෙන් ක්‍රියාකරනු ලබන වාහනයක් හෝ ට්‍රෙයිලර් හෝ ජල යාත්‍රා, ලොකොමෝටිව් හෝ

රෝලින් ස්ටොක් යනාදියෙහි අයිතිය, හිමිකාරිත්වය යනාදියෙන් හෝ එය තුල ඒ මත කරනු ලබන ඕනෑම කාර්යයක් නිසා ඇතිවන (මෙම ඔප්පුවේ සඳහන් කර ඇති හානිපූරණය අදාල වන නමුත්, මෙම ව්‍යතිරේකයට අදාල නොවන) ශාරීරික තුවාල හෝ දේපල හානි. ඕනෑම වාහනයක් පැටවීම හෝ බෑම සම්බන්ධයෙන් ඕනෑම ප්‍රවාහන මාර්ග හෝ මාර්ගයෙහි සීමාවෙන් පිටත ඇතිවන ශාරීරික තුවාල හෝ දේපළ හානි සම්බන්ධයෙන් - එවැනි ශාරීරික තුවාල හෝ දේපල හානි වෙනත් කිසිම ඔප්පුවකින් ආවරණය කර නොතිබුණහොත් මෙම ව්‍යතිරේකය අදාල නොවේ.

ඇ) පහත සඳහන් කරුණක් මගින් හෝ ඒ හරහා හෝ ඒ සම්බන්ධව ඇතිවන ශාරීරික තුවාල හෝ දේපල හානි:

i) ගුවන් යානා ඉන්ධන පිරවීම

ii). ගුවන් යානයක හෝ ගුවන් සේවයක හිමිකාරිත්වය, සන්තකයේ තබා ගැනීම, නඩත්තු කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ භාවිතය

iii). ඕනෑම ගුවන් තොටුපළක හෝ ගුවන් යානා ධාවන පථයක හිමිකාරිත්වය, කුලියට ගැනීම හෝ බදු දීම

ඉ) පරිශ්‍රයේ පරිභෝජනය සඳහා අහඹු ලෙස සපයන ලද ආහාර සහ පාන වර්ග හැර, රක්ෂිතයා විසින් නිෂ්පාදනය කරන ලද, විකුණන ලද, සපයන ලද, ලේබල් කරන ලද, ඇසුරුම් කරන ලද හෝ වෙනත් ආකාරයකින් හසුරුවන ලද නිෂ්පාදන හෝ භාණ්ඩ (බහාලුම් ඇතුලුව) නිසා ඇතිවූ හෝ ඇතිවූ බනට චෝදනා එල්ලවූ,

ඊ) දූෂණය හෝ අපවිත්‍ර වීම නිසා සිදුවන හානි

උ) පුපුරණ ද්‍රව්‍ය කඩා බිඳ දැමීම හෝ සාමාන්‍ය නඩත්තුවෙන් ඔබ්බට ගිය ගොඩනැගිලි

7. දෝෂ සහිත දේ අළුත්වැඩියා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ නැවත ස්ථාපිත කිරීම

අ) රක්ෂිතයා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් කරන ලද වැඩකින් හෝ ඒ මගින් ඇතිවූ,

ආ) රක්ෂිතයා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් සපයන ලද ද්‍රව්‍ය හෝ භාණ්ඩ

8. පහත සඳහන් කරුණු වෙනුවෙන් සමාගම වගකිව යුතු නොවේ:

පහත සඳහන් සිද්ධීන්වල සෘජුව හෝ වක්‍රව, ආසන්නව හෝ දුරස්ථව සිදුවූ හෝ දායකවූ හෝ සොයාගත හැකි හෝ ඒ ආශ්‍රිතව පැන නගින ඕනෑම නීතිමය වගකීමක්:

8.1 යුද්ධය

8.2 කැරලි කෝලාහල, වැඩවර්ජන, සිවිල් කැලඹීම් සහ ත්‍රස්තවාදය (අමතර ආවරණයක් ලෙස ලබාගෙන නොමැති නම්)

9. පහත සඳහන් කරුණු මගින් සෘජුව හෝ වක්‍රව ඇති කරන ලද හෝ දායක වූ හෝ පැන නගින ඕනෑම නීතිමය වගකීමක්:

අ) ඕනෑම න්‍යෂ්ටික ඉන්ධනයකින් හෝ ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයකින් ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමකින් හෝ න්‍යෂ්ටික ඉන්ධනයකින් ඇතිවන විකිරණශීලීතා අයනීකරණය හෝ දූෂණය වීම

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



ආ) ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයක, ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ එහි න්‍යෂ්ටික සංරචකයක විකිරණශීලී, විෂ සහිත පුපුරණ ද්‍රව්‍ය හෝ වෙනත් අන්තරායකර හෝ දූෂිත අන්තර්ගතය

ඇ) පරමාණුක හෝ න්‍යෂ්ටික විඛණ්ඩනය සහ/හෝ විලයනය හෝ ඒ හා සමාන ප්‍රතික්‍රියාවක් හෝ විකිරණශීලී බලයක් හෝ පදාර්ථයක් භාවිතා කරන ඕනෑම යුද අවියක්

10. ඕනෑම දඩ, දඩුවම්, දඩුවම් හානි, ආදිය හෝ අලාභ ගෙවීම සඳහා වන වගකීම

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 සහ 02 "ව්‍යතිරේක" කොටස බලන්න)*

<u>වාරික ගෙවීමේ ක්‍රමය:</u>

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාරිකය වාර්ෂිකව ගෙවිය යුතුය.

<u>හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:</u>

හිමිකම් පෑමකට තුඩු දිය හැකි ඕනෑම සිදුවීමක් පිළිබඳව රක්ෂිතයා විසින් රක්ෂණ සමාගමට වහාම දැනුම් දිය යුතුය.

අවශ්‍ය වන පරිදි රක්ෂණ සමාගම විසින් අලාභ තක්සේරුකරුවෙක්/විමර්ශකයෙක් පත් කරනු ලැබේ.

අවශ්‍ය ලියකියවිලි

1. හිමිකම් පෝරමය, වගකීම් හිමිකම් සම්බන්ධයෙන් තෙවන පාර්ශවයන්ගෙන් ලැබුණු ලිපි.
2. රක්ෂිතයාට එරෙහිව තෙවන පාර්ශවය විසින් පොලීසියට කරන ලද පැමිණිල්ලේ පිටපතක්
3. අධිකරණ ක්‍රියාමාර්ග
4. සිදුවීම්වල වර්ගය අනුව හිමිකම්පෑම සැකසීම සඳහා වන වෙනත් අවශ්‍යතා

සිද්ධියේ තත්ත්වය මත පදනම්ව රක්ෂණ සමාගම විසින් පොලිස් පැමිණිල්ලක් සහ/හෝ අධිකරණ ක්‍රියාමාර්ග ඉල්ලා නොසිටිය හැකිය.

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04 "කොන්දේසි" කොටස බලන්න)*

<u>වංචාව:</u>

මෙම රක්ෂණ ඔප්පුවේ ඇති ඕනෑම හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් වංචනික නම් හෝ රක්ෂිතයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන ඕනෑම අයෙක් විසින් කිසියම් වංචනික ක්‍රමයක් හෝ උපාංගයක් භාවිතා කරන්නේ නම් හෝ හිතාමතාම කරන ලද ක්‍රියාවකින් හෝ රක්ෂිතයාගේ අනුදැනුම ඇතිව යම් විනාශයක් හෝ තුවාලයක් හෝ හානියක් සිදුවුවහොත් මෙම ඔප්පුව යටතේ ඇති සියලුම ප්‍රතිලාභ අහිමි වනු ඇත.

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04 කරුණු අංක 07 යටතේ "කොන්දේසි" කොටස බලන්න)*

<u>ඔප්පු හිමියාගේ වගකීම්:</u>

වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වලක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.
- ඔප්පු කාලසීමාවේදී:- අවදානමේ හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගම දැනුවත් කල යුතුය.

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03 "කොන්දේසි" කොටස බලන්න)*

හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.
- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීම පිළිබඳ ප්‍රතිඥාභාරයට අනුකූල විය යුතුය.

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 05 කරුණු අංක 12 යටතේ "වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරය" කොටස බලන්න)*

<u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:</u>

දැඩි ආශාවකින් අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකතනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් මගින් - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් මගින් - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපෑලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය මගින් - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අපගේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් භාගත කල හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න.

<u>ආරවුල් විසඳීම:</u>

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිලිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්නා:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
අංක 01, බෙතෙස්ඩා පෙදෙස,කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්නා:-

අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොලඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 06 "පැමිණිලි පිළිබඳ ක්‍රියාපටිපාටිය" බලන්න)*

<u>මතක තබා ගත යුතු කරුණු කිහිපයක්</u>

රක්ෂණය අවලංගු කිරීම:

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කල හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කල හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත්

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04 කරුණු අංක 11 යටතේ "කොන්දේසි" කොටස බලන්න)*

මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිලිපැදීම සහ ඉටු කිරීම, මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ රක්ෂණ සමාගමෙහි වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.

<u>වැදගත් සටහන්:</u>

රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාල වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්ෂණයට අදාල ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඉංග්‍රීසි මුද්‍රණයේ ඔප්පුවේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

<u>වැඩිදුර තොරතුරු සඳහා:</u>

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකතනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයන් වෙත පැමිණීමෙන්